**පුත්තලම නගර සභාව - 2022**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පුත්තලම නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පුත්තලම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.1,538,600ක වටිනාකමැති ඉඩම් 02ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් වවුචර් අංක 92 (2023.01.01) මගින් නිවැරදි කර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර ඇති බව. | නිවැරදි කිරීමේ ජ'නල් සටහන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන වර්ෂයේ අවසන් දිනට පෙර යෙදිය යුතුය. |
| (ආ) | තම්මැන්නාවලව්වත්ත නමැති ඉඩම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමේදී රු.200,000ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | ජර්නල් වවුචර් අංක 93 (2023.01.01) මගින් නිවැරදි කර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර ඇති බව. | -එම- |
| (ඇ) | රු.590,398ක එකතු වටිනාකමැති ගණුදෙනු, ගෙවිය යුතු වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් වවුචර් අංක 94 (2023.01.01) මගින් නිවැරදි කර වෙනත් ණයහිමි යටතේ ගිණුම්ගත කර ඇති බව. | -එම- |
| (ඈ) | ඇල්ෆා වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේදී කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතු සියයට 10 රඳවාගත් මුදලින් රු.15,247,164ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජර්නල් වවුචර් අංක 96 (2023.01.01) මගින් නිවැරදි කර ඇති බව. | -එම- |
| (ඉ) | ඇල්ෆා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබාගත් රු.200,000,000ක ණය මුදල සඳහා අදාළ පොළිය රු.4,500,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්තමානයේ දී නිවරැදි කර ඇති බව. | -එම- |
| (ඊ) | ශ්‍රවනාගාරය සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට දරණ ලද රු.1,483,525ක මුදල ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් වවුචර් අංක 97 (2023.01.01) මගින් නිවැරදි කර ඇති බව. | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ රු.920,562ක් වැය කරමින් ඉදිකරන ලද ළදරුවන්ට මව්කිරි ලබාදෙන කාමරය හා ප්‍රේක්ෂකාගාරයක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් වවුචර් අංක 99 (2023.01.01) මගින් නිවැරදි කර ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඌ) | 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ රු.17,370ක් වටිනාකමැති පොහොර තොගය ගිණුම්ගත කර නොතිබුණි. | පොහොර තොගය රු.17,370.00 ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06ක මූලා ප්‍රකාශන අනුව හා උපලේඛන අතර එකතු වටිනාකම රු.2,086,257ක වෙනසක් විය. | ගිණුමේ සහ උපලේඛණයට අනුව ශේෂයන් අතර වෙනස සම්බන්ධයෙන් තොරතුරු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | උප ලේඛන හා ගිනුම් වල ශේෂ නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.651,197,614ක් වූ ගිණුම් ශේෂ 06ක් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන, ඉන්වෙන්ට්‍රි ලේඛන, උප ලේඛන හෝ තොග සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛනයේ විස්තර ඒ වන විට මුළුමනින්ම යාවත්කාලීන කොට නොතිබූ අතර, මේ වන විට යාවත්කාලීන කර ඇති බව. | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන, ඉන්වෙන්ට්‍රි ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ උප ලේඛන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| | (i) | මු.රෙ. 104 (3) | 2018 දෙසැම්බර් 31 වන දින ගබඩාව ගිනි ගැනීමෙන් සිදුව තිබුණු රු.2,255,975ක අලාභය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට අදාළ විමර්ශන සිදු කර දෙන ලෙස දන්වා 2023.04.25 දින දෙවන වරටත් සිහිකැඳවීම් ලිපියක් යොමු කොට ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) | මු.රෙ. 110 | නැතිවීම් හා හානිවීම් සම්බන්ධයෙන් හානි හා පාඩු ලේඛනයෙහි සටහන් | අදාළ විමර්ශනය සිදු කර හානියේ වටිනාකම නිවැරදිව | -එම- |

| | | | |
|---|---|---|---|
| | කළ යුතු වුවත් මෙම අලාභය සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කිරීමෙන් අනතුරුව හානිපාඩු ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කරන බව. | |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) 3.4 ඡේදය | භාණ්ඩ මිලදී ගැනීමේදී මිල ගණන් කැඳවීමක් සිදු කර මිලදී ගැනීම් කළ යුතු වුවත් වාචික දැනුම් දීම මත රු.395,000ක් වටිනා ටේලරයක් මිලදී ගෙන තිබුණි. | මහ සභාවට ඉදිරිපත් කොට ගෙවීම් සිදු කරන ලද බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කල යුතුය. |
| (ii)8.9.1 (ආ) | රු.500,000ක් ඉක්මවන සේවා සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද කුලී සැපයීම් සේවා වෙනුවෙන් එලෙස ගිවිසුම් ගත වී නොතිබුණි. | වර්තමානය වන විට නීති ප්‍රකාරව කටයුතු කරගෙන යන බව. | -එම-. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දින සිට එකතු කළ අගය මත බදුවලින් නගර සභාව නිදහස් කර තිබූ බැවින් තව දුරටත් හිලව් කළ නොහැකි වූ 2022 දෙසැම්බර් 31 දිනට එකතු කළ අගය මත බදු ගිණුමෙහි වූ රු.3,090,905ක හර ශේෂයක් විය. | ඉදිරියේ දී කටයුතු කිරීමට වග බලා ගන්නා බව. | දේශිය අදායම් දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,817,185ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.5,098,968ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 18,144 | 23,279 | 6,736 | 102,120 | 18,435 | 22,589 | 6,373 | 98,559 |
| කුලී | 102,520 | 58,561 | 30,611 | 22,004 | 52,669 | 39,444 | 30,624 | 12,365 |
| බලපත්‍ර ගාස්තු | 2,944 | 1,259 | 1,259 | - | 1,600 | 653 | 653 | - |
| වෙනත් ආදායම් | 30,191 | 19,313 | 19,313 | - | 3,700 | 14,009 | 14,009 | - |
| එකතුව | 153,799 | 102,412 | 57,919 | 124,124 | 76,404 | 76,695 | 51,659 | 110,924 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්** | | |
| | (i) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කළ වරිපනම් හා බදු මුදල වූ රු.23,279,069න් සමාලෝචිත වර්ෂය තුලදී රු.6,735,549ක් රැස් කර තිබූ අතර එය බිල්කළ මුදලින් සියයට 29ක් වැනි අඩු වටිනාකමක් විය. | මහජනතාවට පීඩනයක් නොවන පරිදි වරිපනම් අයකිරීම සිදු කළ බැවින් වරිපනම් අය කිරීම බිල් කළ ආදායමින් 29% ක් වැනි අගයක් පෙන්නුම් කරන බව. | වර්ෂයේ බිල් කළ ආදායම් වර්ෂය තුළදීම රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ හිටි රු.98,559,138ක වරිපනම් හා බදු වටිනාකමින් සමාලෝචිත වර්ෂය තුලදී රු. 11,656,213ක් පමණක් රැස්කර තිබුණු අතර එය වර්ෂය ආරම්භයේ හිඟ හිටි වටිනාකමින් සියයට 12ක් වැනි අඩු වටිනාකමක් විය. | මෙම හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීම සඳහා ක්ෂේත්‍රයේ නිලධාරීන් යෙදවීමටත්, ජංගම සේවා පැවැත්වීමටත්, දේපල තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු සංවිධානය කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (iii) 2018, 2019, 2020 හා 2021 යන වර්ෂයන්වල අනුමත කර ඉදිකර තිබූ ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික නිකුත්කර වරිපනම් තක්සේරු ලබා ගැනීමට කටයුතු නොකර අඩු වරිපනම් වටිනාකමක් අයකර තිබුණු බැවින් නගර සභාවට හිමිවිය යුතු විශාල ආදායමක් අහිමි වී තිබුණි. | තක්සේරු දෙපාරේතමේන්තුව විසින් වාර්තා එවීම ප්‍රමාද වන බැවින් මෙම මුදල අය කර ගැනීම ගැටලුවක්ව පවතින බව. | අනුමත කර තිබූ ගොඩනැගිලි අයදුම්පත් සඳහා වරිපනම් තක්සේරු ලබා ගැනීම මඟින් ආදායම් ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (iv) 2016 වර්ෂයේ සිදු කළ වරිපනම් බදු තක්සේරුව මත 2022 වර්ෂය සඳහා ද වරිපනම් අය කරමින් පැවතුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නව වරිපනම් බදු තක්සේරුව සිදු කිරීම ආරම්භ කරන බව දන්වා ඇති බව. | නව වරිපනම් තක්සේරුවක් සිදු කර ආදායම් ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | **කුලී** | | |
| | (i) සමාලෝචිත වර්ෂයේ බිල්කළ කඩ කුලී හා බදු කුලී රු.58,560,820න් වර්ෂය තුලදී රු.30,610,604ක් රැස්කර තිබුණු අතර එය බිල්කළ වටිනාකමින් සියයට 52ක ප්‍රමාණයකි. | කඩ කුලී මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | වර්ෂයේ බිල් කළ ආදායම් වර්ෂය තුළදීම රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ හිටි කඩ කුලී හා බදු කුලී ආදායම රු.12,364,899න් වර්ෂය තුලදී | කඩහිමියන් ලිපි මඟින් හා ක්ෂේත්‍රයේ ගොස් දැනුවත් කිරීම , කඩ සීල් කිරීම වැනි වැඩසටහන් | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| රු.5,049,244ක් රැස් කර තිබුණු අතර එම වර්ෂය ආරම්භයේ හිඟ හිටි වටිනාකමින් සියයට 41ක ප්‍රමාණයකි. | මඟින් හිඟ කඩ කුලී අය කර ගැනීම සඳහා කටයුතු කර ඇති බව. | යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාළව භාණ්ඩ අයිතම 114ක ඌනතාවයන් හා භාණ්ඩ අයිතම 76ක අතිරික්තාවයන් පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අබලි භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් පසුව නිරවුල් කරන බව. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා නිර්දේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | සයන්ස් ලැන්ඩ් සොෆ්ට්වෙයාර් සමාගමින් රු.1,050,000ක් වටිනා තිබස් මෘදුකාංගය මිලදී ගෙන තිබූ අතර මෙම මෘදුකාංගය සඳහා ගෙවා තිබූ රු.175,000ක් වටිනා වවුචරය විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදී. එසේම මෙම මෘදුකාංගයට ඇතුළත්ව තිබෙන ගබඩා මෘදුකාංගය හා වැටුප් වේතන මෘදුකාංගය 2022 වර්ෂයේ ඔක්තෝබර් 05 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබීම නිසා අවු.09ක පමණ කාලයක් නිශ්ක්‍රීයව පවතුණි. | ගබඩා මෘදුකාංගය හා වැටුප් වේතන මෘදුකාංගය වර්තමානය වන විට භාවිතා කිරීම සඳහා දත්ත ඇතුළත් කරමින් සිටින බව. | ගබඩා මෘදුකාංගය හා වැටුප් වේතන මෘදුකාංගය කඩිනමින් කටයුතු කල යුතුය. |
| (ඇ) | ඇල්ෆා වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම | | |
| | i. සියලු කඩ කාමර අලෙවිය මත සභාවට ලැබිය යුතු පෙර මුදල් (key money) වටිනාකම රුපියල් මිලියන 717ක් වුවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වසර 03කට ආසන්න කාලයක් ගත වී ඇතත් සභාව විසින් රැස් කරගෙන තිබූ වටිනාකම රුපියල් මිලියන 253ක් පමණක් වූ අතර එය මුළු වටිනාකමින් සියයට 35ක් විය. | අවබෝධතා ගිවිසුම් අත්සන් කර පෙර මුදල් අය කිරීමේ කටයුතු කඩිනම් කර ඇති බව. | පෙර මුදල් අය කිරීමේ කටයුතු කඩිනම් කල යුතුය. |
| | ii. කඩ කාමර බඳුදීමට අදාළ ටෙන්ඩර් කොන්දේසි 12 ප්‍රකාරව බිම් මහලේ වහළ මට්ටම දක්වා වැඩ අවසන් වූ පසු සම්පූර්ණ පෙර මුදලම (key money) ගෙවා අවසන් කළ යුතුව තිබූ අතර 2020 නොවැම්බර් මස වන විට බිම් මහලේ වහළ මට්ටම දක්වා කටයුතු අවසන්ව තිබුණි. 2022 ඔක්තෝම්බර් මස අවසන් වන විට ව්‍යාපෘතිය ආරම්භ කර වසර 03කට ආසන්න කාලයක් ගත වී තිබුණද බිම් මහළට අදාළව ලංසු වටිනාකමින් සියයට 100ක් ගෙවා අවසන්ව තිබුණේ කඩ කාමර 62න් කඩ කාමර 11ක් සඳහා පමණි. | නියමිත කාලසීමාව තුළ මුදල් නොගෙවූ කඩ කාමර හිමියන් සමඟ ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කළ අතර එම කඩ කාමර නැවත ටෙන්ඩර් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතින බව. | ටෙන්ඩර් කොන්දේසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| iii. ටෙන්ඩර් කොන්දේසි 13 ප්‍රකාරව අත්තිවාරම් ආරම්භ කළ දින සිට දින 07ක් තුළ තාවකාලික අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ යුතු විය. එහෙත් අත්තිවාරම් කටයුතු 2020 පෙබරවාරි මස වන විට අවසන් ව තිබුණද අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම 2022 අගෝස්තු මස සිදු කර තිබූ අතර වසර 02කට අධික කාලයක් ගිවිසුම් අත්සන් කිරීමට වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු නොකිරීම මත සභාව දැනුවත් කිරීමකින් තොරව කඩ කාමර ලබා ගත් පුද්ගලයින් විසින් වෙනත් අයට වැඩි වටිනාකම්වලට විකිණීම තුළින් ලාභ ලැබීමට අවස්ථාවක් සැලසීම, කොටස් ගෙවීම් අතරතුර අයිතිය මාරු කිරීම් සිදු වීම, ගිවිසුම් කොන්දේසි කඩ කිරීම මත ගිවිසුම් අවසන් කිරීමට සභාවට නොහැකි වීම හා හිඟ මුදල් නොගෙවීම මත නෛතික ක්‍රියාමාර්ග ගැනීම ගැටළු සහගත වීම වැනි තත්ත්වයන් පැන නැගී තිබුණි. | රුපියල් මිලියන 300.7 කට ආසන්න පෙර මුදල් ප්‍රමාණයක් අයකර ඇත.ඉතිරි මුදල්ද කඩිනමින් අය කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව. | -එම- |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුත්තලම නගර සභාවට පැවරුම් නියෝගයකින් ලද පිඹුරු 09කින් හිමි වූ අක්කර 469 රූඩ් 6 පර්චස් 09ක ඉඩම් 39ක භෞතික අයිතිය තහවුරු කර ගැනීම සභාව අපොහොසත් වී තිබුණු අතර මෙම සියළු ඉඩම් මේ වන විට අනවසර පදිංචිකරුවන් විසින් විටින් විට අල්ලා ගෙන තිබුණි. තවද නගර සභාව විසින් භාවිතා කරන ඉඩම් කොටස් 51ක අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ සභාව/මහවැලි අධිකාරිය හෝ වෙනත් ආයතනයකට අයත් වූ අතර ඒවා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීම පවරා සඳහා කඩිනමින් කටයුතු කල යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ විධායක, තෘතියික, ද්විතියික හා ප්‍රාථමික ශ්‍රේණිවලට අයත් සේවකයින් 79ක් පුරප්පාඩුව ද ද්විතියික හා ප්‍රාථමික ශ්‍රේණිවලට අයත් සේවකයින් 93ක් අතිරික්තව ද සිටින බව නිරීක්ෂණය විය. | සෞඛ්‍ය කම්කරු සහ වැඩ කම්කරු තනතුරේ සේවකයින් යොදවා මහජන සේවය සිදුකළ හෙයින් ප්‍රාථමික තනතුරු ශ්‍රේණියේ අතිරික්තයක් ඇතිවුණ බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවේ විවිධ ආදායම් රැස් කිරීම සඳහා සේවකයින් 05දෙනෙකු උපයන ආදායමින් සියයට 30ක් ගෙවීමේ පදනම මත නගර සභාවට බඳවාගෙන තිබුණි. එම සේවකයින් බඳවාගත් දිනයේ සිට එසේ කොමිස් මුදල් ගෙවා තිබූ අතර 2022 | මෙය 14 වන සභා වාරයට පෙර ගත් තීරණයක් වන බැවින් මේ සම්බන්ධයෙන් අදාළ තොරතුරු ලේඛනාගාරයෙන් සොයා බලමින් පවතින බව. | අදාල ලිපි ලේඛන ඉදිරිපත් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ පමණක් රු.1,010,883ක් ගෙවා තිබුණි. එසේ වුවද, එම සේවකයින් බඳවාගත් දිනයක් හෝ බඳවා ගැනීමට අනුමැතියක් සභාව සතු නොවුණු අතර මෙම සේවකයින් සඳහා විධිමත් පත්වීමේ ලිපියක්ද ලබා දී නොතිබුණි. | | |
| (ඇ) | විශ්‍රාම ගිය සේවකයින් 94 දෙනෙකුගෙන් අයවිය යුතු රු.179,694ක් වූ ණය ශේෂයක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | රු.179,694 කපා හැරීමට අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් මඟින් ඉදිරිපත් කර ඇති බව. | අයවිය යුතු ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු විවිධ කර්තව්‍යයන් 10ක් ඉටු කිරීම සඳහා රු.3,875,600ක මුදලක් වැයකර තිබුණද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි. | අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කර නොගැනීමට මූලික හේතුව වූයේ පසුගිය වසරෙහි ආරම්භ වූ ආර්ථික අර්බුදය බව. | ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු වැඩසටහන් අපේක්ෂිත පරිදි ඉටු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 79ක් සඳහා සලසාගෙන තිබුණු රු. 298,329,764ක් වූ ප්‍රතිපාදිත මුදල් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | 2022 වර්ෂයේ පැවති තෙල් අර්බුදය හේතුවෙන් රට තුළ ඇති වූ ආර්ථික අර්බුදය නිසා මුදල් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. | කටයුතු නිසි පරිදි ඇස්තමේන්තු කර අයවැය පාලන කටයුතු සිදු කළ යුතුය. |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා හඳුනාගත් ක්‍රියාකාරකම් 08ක් සම්පූර්ණයෙන් ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරම් 08 ක් සම්පූර්ණ ඉටු කර ගැනීමට නොහැකි වීමට හේතුව එම කාලයේ ඇති වූ ඉන්ධන අර්බුදය හා රටේ ඇති වූ අසීමිත මිල ගණන් වල වෙනස් වීම බව. | හඳුනා ගත් ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |